2024 ජනවාරි 24

ASSOCIATION OF
ACCOUNTING TECHNICIANS
OF SRI LANKA



# සුපිරි වට්ටමක් අත්විඳිමින් AAT සමඟ නැවත සම්බන්ධ වන්න...!

## පිළිගත් වෘත්තීය ගණකාධිකාරීවරයෙකු වීමටත්, උපාධි, පශ්චාත් උපාධි සහ වෙනත් උසස් වෘත්තීය සුදුසුකම් වෙත කඩිනමින් පිවිසීමටත් සුවිශේෂී මඟක්...

**දයාබර ශිෂ්‍යය,**

අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින ඔබට ප්‍රථමයෙන් මාගේ සුබ පැතුම් එක් කිරීමට කැමැත්තෙමි. 2021 වර්ෂයේදී AAT ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචි වී AAT අධ්‍යාපන මඟට පිවිස ඔබ ලබා ගත්තා වූ දැනුම හා පන්නරය අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී විශිෂ්ට දක්ෂතා දැක්වීමට මහඟු අත්වැලක් වන බව අපේ විශ්වාසයයි. දේශීයව මෙන්ම විදේශීයව ඉහළ පිළිගැනීමක් ඇති ඒ.ඒ.ටී. සම්පූර්ණ කිරීම ඔබේ මීළඟ ඉලක්කය විය යුත්තේ පිළිගත් වෘත්තීය සුදුසුකමකින් සවිමත්ව රැකියා ලොවට පිවිසීමේ අභියෝගය ජය ගැනීමට ඉන් ලැබෙන මහඟු අත්වැල නිසාවෙනි. දැනටමත් AAT මඟට ප්‍රවිෂ්ට වී ඇති ඔබට දැන් අවශ්‍ය වන්නේ **ඔබේ ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කරගෙන AAT සම්පූර්ණ කිරීම පමණි.** ඔබට AAT අවසාන විභාගය වන තෙක් ඔබ කැමති මාධ්‍යයකින් (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) AAT විභාග හැදෑරිය හැක.

### ශිෂ්‍යභාවය යාවත්කාලීන කරගනිමින් A/L අවසන් වූ විගසම ඔබගේ ප්‍රථම වෘත්තීමය සුදුසුකම සම්පූර්ණ කරගන්න!

බොහෝ සිසුන් තම පාසල් අධ්‍යාපනය අතරතුරදීම AAT විභාග සම්පූර්ණ කරමින් තම අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙරාතුව AAT අවසන් විභාගය සමත් විජයග්‍රාහී ගොන්නට එකතු වේ. කෙසේ වුවත් යම් බාධාවක් නිසාවෙන් **ඔබේ මුල්ම වෘත්තීමය සුදුසුකම** සම්පූර්ණ කිරීම තාවකාලිකව නවතාලන්නට ඔබට සිදුවූ බැව් අපට හැඟේ. කණගාටු නොවන්න!. නැවත AAT ශිෂ්‍ය ප්‍රජාව සමග සම්බන්ධ වී ඔබේ වෘත්තීය මඟ හෙළි කරගන්නට අනගි අවස්ථාවක් දැන් උදාවී ඇත.

### අ.පො.ස. උසස් පෙළින් පසුව AAT සමග නැවත සම්බන්ධ වීම ඔබගේ හොඳම තේරීම වන්නේ ඇයි?

- **මාස කීපයක් ඇතුළත පූර්ණ වෘත්තීය සුදුසුකමක් -** AAT පළමු සහ දෙවන අදියරයන් 2024 ජූලි විභාගයේදී සම්පූර්ණ කර, 2025 ජනවාරි විභාගයේදී AAT අවසන් අදියර සම්පූර්ණ කිරීමෙන් **NVQ ඩිප්ලෝමාධාරී අවසන් අදියර සමතෙකු [PF]** වීමට ඔබ සුදුසුකම් ලබනු ඇත. තරුණ වෘත්තිකයෙකු ලෙස ඔබගේ ජීවිතයේ අනාගත විශිෂ්ට ජයග්‍රහණ කරා මෙවන් කෙටි කාලයක් තුළ අවතීර්ණ වීමට AAT හැර වෙනත් කිසිම වෘත්තීමය සුදුසුකමකින් අවස්ථාව නොලැබෙනු ඇත.
- **AAT පළමු අදියරෙහි විෂයයන් බොහෝමයකින් නිදහස්වීම් හිමිවීම -** ඔබගේ අ.පො.ස. උසස් පෙළ (අදාළ AAT විෂයයන් දැනට සම්පූර්ණ කර නැත්නම්) සාමාර්ථයන් අනුව ඔබට AAT පළමු අදියරේ විෂය නිදහස් වීම් සඳහා හිමිකම් කීමේ හැකියාව සමඟ ඉක්මණින් AAT අවසන් කිරීමේ අවස්ථාව උදාවේ.
- **විශ්වවිද්‍යාල අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශයන් -** රජයේ විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලබන්නේ ඉතාම අතලොස්සක් බව ඔබ අප කවුරුත් දන්නා කරුණකි. AAT සුදුසුකම තුළින් **දේශීය මෙන්ම විදේශීය විශ්වවිද්‍යාල සඳහා ලියාපදිංචි වීමට** මෙන්ම නිදහස් වීම් ලබා ගැනීමටත් ඔබට ඉතා අනගි අවස්ථාවක් ලැබෙනු ඇත. ඔබගේ උපාධි සිහිනයන් බොඳවී යා නොදී රැකගැනීමට AAT සුදුසුකම මහඟු අත්වැලකි.
- **ඉහළ ඉල්ලුමක් සහිත රැකියා අවස්ථා -** සුදුසුකම් ලත් වෘත්තිකයන් සඳහා රැකියා වෙළෙඳපොළ තුළ ඉහළ රැකියා අවස්ථාවන් ඇති අතර, **AAT සුදුසුකම** ඔබගේ වෘත්තීය ගිණුම්කරණ රැකියා ජීවිතයේ ප්‍රවිෂ්ටයේදී **ප්‍රධානම සුදුසුකම** බවට පත්වේ. අ.පො.ස. උසස් පෙළ පමණක් සමතුන් අතර AAT වෘත්තීය සුදුසුකම ද සමග ඔබ නිසැකවම කැපී පෙනෙනු ඇති අතර සේවා යෝජකයන්ගේ ප්‍රමුඛතාව ද ඔබට හිමිවනු ඇත.
- **ශ්‍රී ලංකාවේ ලාබාලතම වෘත්තීය සාමාජිකයෙකු වීමේ වරම -** AAT අවසන් විභාග සමතකු [PF] වීමත් සමග අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව සහ පුද්ගල හා නායකත්ව වැඩමුළුව සම්පූර්ණ කිරීමෙන් ඉතා අඩු වයසකදී **AAT සාමාජිකත්වය [MAAT]** ලබා ගැනීමට ඔබට අවස්ථාව උදාවේ. BMICH හිදී පැවැත්වෙන **වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවයේදී** AAT සාමාජිකත්ව සහතිකය ලැබීමේ මොහොත ඔබේ ජීවිතයේ අපූරු කඩඉමක් වනු ඇත. AAT සාමාජිකත්වයට හිමිකම් කීමෙන් පසු ඔබේ නම අගට **'MAAT' තනතුරු නාමය** භාවිතා කිරීමේ වරප්‍රසාදය ද ඔබට හිමිවේ.

**70% කට ආසන්න සුවිශේෂී වට්ටමක් දක්වා**

### AAT සමඟ නැවත සම්බන්ධ වන්නේ කෙසේද?

ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය 2024 වර්ෂය සඳහා අලුත් කිරීමෙන් AAT සමග නැවත සම්බන්ධ වීමට හැකියාව ඇත. ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කරගන්නා ඔබට ඊට අදාළ මුදලින් **70% කට ආසන්න සුවිශේෂී වට්ටමක් දක්වා** (අවසන් වරට ලියාපදිංචිය අලුත් කළ වසර මත පදනම්ව) ඔබ වෙනුවෙන්ම දැන් අපෙන්!

| | | |
|---|---|---|
| අති විශේෂ වට්ටම යටතේ ගෙවිය යුතු මුදල | | **රු. 2,500/- ක් පමණි** |
| වට්ටම අවසන් වන දිනය | | **2024 අප්‍රේල් 30** |
| ගෙවීමේ ක්‍රම :<br>**බැංකුවට >** | පළමු ක්‍රමය<br>[NSB / HNB] | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ **[NSB]** හෝ හැටන් නැෂනල් බැංකුවේ **[HNB]** ඕනෑම ශාඛාවක්.<br>**ගෙවීම් වවුචර** : ඉහත බැංකු වල තබා ඇති සාමාන්‍ය මුදල් තැන්පතු පත් භාවිතා කළ යුතුය. [**CDM යන්ත්‍ර හරහා ගෙවීම් කිරීමෙන් වළකින්න**]<br>ගිණුම් අංක : NSB – 90_ _ _ 2301989 / HNB- 039020327099 |
| | ගෙවීම් යොමු අංකය | "44" මුලින් යොදා **අංක 7කින් යුත් ඔබේ ශිෂ්‍ය ලියාපදිංචි අංකය** නිවැරදිව සඳහන් කළ යුතුය. (උදා : 44xxxxxxx)<br>(මෙම අංක 07කින් යුත් **ශිෂ්‍ය ලියාපදිංචි අංකය** ඔබේ ශිෂ්‍ය හැඳුනුම්පතේ මෙන්ම මෙම ලිපිය එවන **ලියුම් කවරයේ ඔබේ නම ඉදිරියෙන් ද සඳහන් කර ඇත**.)<br>ඉහත යොමු අංකය සඳහන් නොකළහොත් හෝ වැරදියට සඳහන් කළහොත් ඔබේ ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ ඔබේ මුදල් අන් අයෙකුගේ ගිණුමකට බැර වීම සිදුවිය හැක. |
| **මාර්ගගත ක්‍රමයට >** | හෝ<br>දෙවන ක්‍රමය<br>[Online] | www.aatsl.lk වෙබ් අඩවියට පිවිස online payment යටතේ ඇති "instructions for existing students' renewal - online" හරහා ගෙවීම. **මෙම ගෙවීම් ක්‍රමයේදීද ඉහත සඳහන් ගෙවීම් යොමු අංකය නිවැරදිව සඳහන් කළ යුතුය.** |

ඔබගේ යොමු අංකය නිවැරදිව සඳහන් කර අදාළ ලියාපදිංචිය අලුත් කිරීමේ මුදල තැන්පත් කළහොත්, ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම සතියක් වැනි කාලයක් තුළ සිදුවනු ඇත. (AAT ශිෂ්‍ය හැඳුනුම්පත අප වෙත එවීමට අවශ්‍ය නොවේ.)

